# *මහින්ද රාජපක්ෂ විද්‍යාලයය, හෝමාගම.*
# *අවසාන වාර පරීක්ෂණය - 2012*
# *ජීවන නිපුණතා හා පුරවැසි අධ්‍යාපනය*
# *6 ශ්‍රේණිය*

*කාලය - පැය 2 යි*

**<u>1 කොටස</u>**

**සියලුම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.**

**නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අදින්න.**

1 අත්මාවබෝධය යන්න නිර්වචනය සඳහා අදාල පිළිතුර වන්නේ,

I තමා පිළිබඳ ව ඇති අභිමානයයි

II තම විසින් තමා පිළිබඳ හොඳින් තේරුම් ගැනීමයි.

III තමා පිළිබඳ ව ඇති විශ්වාසයයි.

IV තමා පිළිබඳ ඇති ආඩම්බර කමයි.

2 විස්තෘත පවුලේ සාමාජිකකයන් වන්නේ,

I මව, පියා II මව,පියා, දරුවන්

III මව, පියා, හිතමිතුරන් IV මව, පියා, දරුවන්, අනෙකුත් නෑදැයින්

3 සහානුභූතිය යනු ,

I හැඟීම් ප්‍රකාශ කිරීමයි II අන්‍යයන්ට පිහිටවීමයි

III අන්‍යෝන්‍ය ගෞරවයයි IV අනුන්ට වූ කරදරයක් තමාට වූවා සේ සලකා උපකාර කිරීමයි.

4 ශ්‍රී ලංකාවේ සම්පත් ප්‍රධාන වශයෙන් කොටස් දෙකකට බෙදිය හැකිය. ඒවා නම්,

I ස්වාභාවික හා කෘත්‍රිම සම්පත් II භෞතික හා මානව සම්පත්

III ස්වභාවික හා අස්වාභාවික සම්පත් IV විශාල හා කුඩා සම්පත්

05 හොඳ සන්නිවේදකයෙකු තුළ තිබිය යුතු ගුණාංගයක් වන්නේ,

I වේගවත්ව කතාකිරීමට හැකිවීම II නිහඬතාවය ආරක්ෂා කිරීම

III තමා කියන දේ පමණක් වැදගත් කොට සැලකීම IV පණිවිඩය උචිත භාෂාවකින් ප්‍රකාශ කිරීම

**හිස්තැනට සුදුසු වචනය තෝරා හිස්තැන සම්පූර්ණ කරන්න.**

06........................................................අපගේ විනය හා ශික්ෂණය හැඩගස්වයි.

(නීතිරීති/ පොත්පත්)

07 සමාජයේ යහපත් යයි පිළිගත් හැසිරීමට විරුද්ධව ඔබ ක්‍රියාකළ හොත් සමාජ .................................. පුද්ගලයෙකු වේ. (විරෝධී/ හිතකාමී)

08. අනුරාධපුර සමාධි පිළිමයේ නිරූපිත මුද්‍රාව වන්නේ ........................................ මුද්‍රාවයි .

(ධ්‍යාන /අභය)

09. පාසලක අභිමානය වනුයේ පාසලේ.......................................යි (නම/ ගීතය)

10. බස්නාහිර පළාතට අයත් දිස්ත්‍රික්ක ගණන ...........................................කි. (දෙකකි/තුනකි)

11. විනය ලෙස හඳුන්වන්නේ ඔබගෙන් අපේක්ෂා කරන ..............................................යි.

(ශික්ෂණය/හැසිරීම් රටාව)

12 තිරුකේතීස්වරම් කෝවිල පිහිටා තිබෙන්නේ ................................................දිස්ත්‍රික්කයේය

(මන්නාරම්/පුත්තලම්)

13. සීගිරිය රාජධානිය බවට පත්කර ගත්තේ .......................................රජතුමාය. (කාශ්‍යප/ මුගලන්)

14. ශ්‍රී ලංකාවේ මධ්‍ය කඳුකරයේ සානු හා බෑවුම් සහිත ප්‍රදේශ වල ...............................වගා කරයි.

(රබර්/ තේ)

15. යහපත් පුරවැසියෙකු හැමවිටම ........................................භාෂාව භාවිතා කරයි. (ආචාරශීලිව/සිංහල)

**පහත දී ඇති වගන්ති හරිනම් (√) ලකුණ ද වැරදි නම් ( X ) ලකුණද වරහන තුළ යොදන්න.**

16. සංවේදීතාව යනු මිනිස්කම ගොඩනඟන ශක්තියයි. ( )

17. භෞතික සම්පත් සීමිත බැවින් ඒවා අරපිරිමැස්මෙන් භාවිතා නොකළ යුතුය ( )

18. මස්ජිදය ක්‍රිස්තියානි ආගමේ සිද්ධස්ථානයයි. ( )

19. පළාත්සභාව තුළින් පළාත් මට්ටමින් ආණ්ඩුවේ පාලන කටයුතු පහසු කරයි. ( )

20. අපක්ෂපාතිවීම සේවා සපයන්නන්ගේ යුතුකමකි. ( )

(ලකුණු 40 යි )

## II කොටස

**පළමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න පහකට පිළිතුරු ලියන්න.**

01

I. න්‍යෂ්ටික පවුල හා විස්තෘත පවුල හඳුන්වන්න. ( ල 2)
II. සාරධර්ම ඇතුළත් පොත් දෙකක් සඳහන් කරන්න. ( ල 2)
III. සැලසුමකට අනුව වැඩ කිරීමෙන් ලැබෙන වාසි දෙකක් ලියන්න ( ල 2)
IV. අන්තර් පුද්ගල සම්බන්ධතාවක් තුළ දැකිය හැකි ලක්ෂණ දෙකක් ලියන්න. ( ල 2)
V. තැපැල් කාර්යාලයෙන් සැලසෙන සේවා දෙකක් ලියන්න. ( ල 2)
VI. ලංකාවේ මධ්‍යම පළාතට අයිති දිස්ත්‍රික්ක දෙකක් ලියන්න. ( ල 2)

02 අධි සංවේදී බව යනු කුමක්ද? ( ල 2)

I. සමාජයේ විශේෂ අවශ්‍යතා ඇති පුද්ගලයන් ලෙස හඳුන්වන්නේ කවුදැයි උදාහරණ දෙකකින් ලියන්න. ( ල 2)
II. පරිසර සංරක්ෂණය යනු කුමක්ද ? ( ල 3)
III. පුද්ගලයන් පරිසරයට හානිකරන ක්‍රම හතරක් ලියන්න ( ල 4)

03

I. පාසල් ව්‍යුහය තුළ ඇති සංවිධාන දෙකක් ලියන්න. ( ල 2)
II. පාසලෙන් රජයට සිදුවන සේවා 2 ක් ලියන්න. ( ල 2)
III. පාසලේ ඉතිහාසය පිළිබඳව තොරතුරු සොයාගත් හැකි මූලාශ්‍ර තුනක් ලියන්න ( ල 3)
IV. පාසලක අනන්‍යතාව පෙන්නුම් කරන ලක්ෂණ හතරක් ලියන්න. ( ල 4)

04

I. සේවා සපයන්නන්ගේ යුතුකම් දෙකක් ලියන්න. ( ල 2)
II. සිද්ධස්ථානවලින් ඉටුවන සේවා තුනක් ලියන්න. ( ල 3)
III. අප ජීවත්වන ප්‍රදේශය හඳුන්වාදීමේදී වැදගත්වන කරුණු තුනක් ලියන්න. ( ල 3)
IV. රටක ආර්ථික කටයුතු ප්‍රධාන වශයෙන් කොටස් තුනකට බෙදිය හැකිය. ඒවා නම් කරන්න ( ල 3)

05

I. භෞතික පරිසරය හා සංස්කෘතික පරිසරය හඳුන්වන්න. ( ල 2)

II. සම්පත් සංරක්ෂණය කිරීම වැදගත්වීමට හේතු දෙකක් ලියන්න. ( ල 2)

III. වාතය, ජලය හා පස මිනිස් ක්‍රියාකාරකම් නිසා දූෂණය වීමෙන් අපට මුහුණ දීමට සිදුවන අහිතකර තත්ව තුනක් ලියන්න. ( ල 3)

IV. පරිසර දූෂණය වන ප්‍රධාන ක්‍රම හතරක් දක්වන්න. ( ල 4)

06

I. පොදු දේපළ යනු මොනවාද? ( ල 2)

II. විනය හා ශික්ෂණය වෙන්වෙන්ව හඳුන්වන්න. ( ල 2)

III. විනයානුකූල පුද්ගලයෙකු සතු ගුණාංග තුනක් ලියන්න. ( ල 3)

IV. සදාචාරවත් පුරවැසියෙකු තුළ දක්නට ලැබෙන ගුණාංග හතරක් ලියන්න. ( ල 4)